චතාරික සමය පළමුවන ඉරුදින

**දේව ප්‍රකාශන**

26-02-12

## පළමුවන කියැවීම

උත්පත්ති 9:8-15

උත්පත්ති පොතෙන් ගත් පාඨයෙකි.

"මම නුඹ සමග පිහිටුවන ලද ගිවිසුම සිහි කරන්නෙමි."

දෙවියන් වහන්සේ නෝවාට ද, ඔහුගේ පුත්‍රයන්ට ද කතා කොට, "මෙන්න, මම නුඹලා සමග ද, නුඹලාගේ පෙළපත සමග ද නුඹලා සමග නැවෙන් නික්මුණු සියලු ජීවමාන සතුන් වන, පක්ෂීන් ගව මහීෂයන් හා වන මෘගයන් සමග ද ගිවිසුමක් පිහිටුවමි. නුඹලා සමග පිහිටුවන ලද ගිවිසුම වනාහි මින්පසු කවදාවත් ජල ගැල්මකින් සියලු ජීවමාන සතුන් විනාශ කරනු නොලබන බවත්, මින්පසු කවදාවත් ජල ගැල්මකින් මහ පොළොව වනසනු නොලබන බවත් යැ" යි වදාළ සේක. තවද, දෙවියන් වහන්සේ කතා කොට, "මා හා නුඹලා ද, නුඹලා සමග සිටින සියලු ජීවමාන සතුන් ද අතර මතු සියලු පරම්පරාවන් සඳහා මා පිහිටුවන ගිවිසුම් ලකුණ නම් මෙය යි. වළාකුළුවල මම මාගේ දේදුන්න තබමි. මා හා ලෝකයා අතර පිහිටුවන ලද ගිවිසුම් ලකුණ එය වන්නේය. පොළොවට ඉහලින් වළාකුළු පැමිණ වළාකුළු අතර දේදුන්න දිස්වන කල මා හා නුඹලා ද, සියලු ජීවමාන සතුන් ද අතර මින්මතු කවදාවත් ජල ගැල්මකින් සියළු ජීවමාන සතුන් විනාශ නොකිරීමට පිහිටුවා ගත් ගිවිසුම සිහි කරන්නෙමි." යි වදාළ සේක.

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 41:1-4,12-13

පිළිතුර: සමිඳුනී, ඔබ වහන්සේගේ සත්‍යයේ හා කරුණාවේ මාවත් මට පැහැදිලි කළ මැනව.

ගීය: සමිඳුනි, ඔබ වහන්සේගේ ක්‍රියා මාර්ගය මට හෙළි කළ මැනව. ඔබේ මාවත් මට පැහැදිලි කළ මැනව. ඔබේ සත්‍යය අනුව මා ගෙන ගිය මැනව. මන්ද, ඔබ මාගේ විමුක්ති දායක දෙවිඳාණෝ ය. දවස පුරා ඔබ එන මඟ බලා සිටිමි.

සමිඳුනි, ඔබ වහන්සේගේ කරුණා ගුණයත්, තිර පෙමත් සිහි කළ මැනව. මේවා ඔබේ චිරාගත ගුණාංගයෝ ය. සමිඳුනි මාගේ යොවුන් වියේ පාප ද අපරාධ ද සිහි නොකළ මැනව. සමිඳුනි, ඔබේ යහපත්කම ද මහා කරුණාව ද අනුව මා සිහි කළ මැනව.

සමිඳාණෝ යහපත් ය. අවංකය. එතුමාණෝ පව්ටුන් හට යා යුතු මාර්ගය උගන්වන සේක. එතුමාණෝ නිහතමානී අය යුක්තියෙහි හසුරුවන සේක. එතුමාණෝ යටහත් පහත් අයට තම මාර්ගය උගන්වන සේක.

## දෙවන කියැවීම

1පේදුරු 3:18-22

ශුද්ධ වූ පේදුරු තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

ජලගැල්ම ගැළවීම ගෙන දෙන බෞතීස්ම - ස්නාපනයේ පෙර නිමිත්තකි.

ක්‍රිස්තුස් වහන්සේ ඔබේ පව් උදෙසා වරක් දිවි පිදූ සේක. උන් වහන්සේ ධර්මිෂ්ඨ ව සිටි නමුත් දෙවියන් වහන්සේ වෙතට ඔබ පමුණුවන පිණිස අධර්මිෂ්ඨයන් වෙනුවෙන් දිවි පිදූ සේක. උන් වහන්සේ මනුෂ්‍ය ස්වභාවයෙන් මරණයට පත් කරනු ලැබූ සේක. දිව්‍ය ස්වභාවයෙන් උත්ථාන කරනු ලැබූ සේක. එම දිව්‍ය ස්වභාවයෙන් උන් වහන්සේ ගොස් සිර ගෙයි සිටි ආත්මයන්ට දේශනා කළ සේක. ඔව්හු වනාහි නෝවාගේ කාලයේ දී ඔහු නැව සාදන අතර, දෙවියන් වහන්සේ ඉවසිල්ලෙන් සිටියදී උන් වහන්සේට අකීකරු වූ ආත්මයන් ය. ඒ නැවට ඇතුළු වූ ස්වල්ප දෙනෙක්, එනම් අට දෙනෙක් වතුරෙන් ගළවනු ලැබුවෝ ය. මෙහි වතුර යන්නෙන් අදහස් කරනු ලබන්නේ බෞතීස්ම-ස්නාපනය ය. බෞතීස්ම-ස්නාපනය වනාහී ශරීරයේ කිළුටු සේදීමක් නොව, නිදොස් හෘදය සාක්ෂියකින් දෙවියන් වහන්සේට කරන පොරොන්දුවක් ය. එයින් දැන් ඔබ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පුනරුජ්ජීවනය කරණකොටගෙන ගැළවීම ලබන්නහු ය. උන් වහන්සේ ස්වර්ගයට වැඩමකර දෙවියන් වහන්සේගේ දකුණත වැඩ සිටින සේක. දේව දූතයෝ ද බලතාවයෝ ද ආනුභාවයෝ ද උන් වහන්සේට යටත් කරනු ලැබූහ.

දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

මතෙව් 4:4

"මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව,
දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් යැ." යි
ස්වාමීන් වහන්සේ වදාළ සේක.

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 1:12-15

සුවිශේෂක මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

සාතන් විසින් පරීක්ෂා කරනු ලැබූ ජේසුස් වහන්සේට දේව දූතයෝ උපස්ථාන කළහ.

එම ඇසිල්ලෙහි ආත්මයාණෝ ජේසුස් වහන්සේ පාළුකරයට පැමිණෙවූ සේක. උන් වහන්සේ සාතන් විසින් පරීක්ෂා කරනු ලබමින් දින සතළිසක් පාළුකරයෙහි විසූ සේක. උන් වහන්සේ වන සතුන් අතර විසූ සේක. දේව දූතයෝ උන් වහන්සේට උපස්ථාන කළහ. ජුවාම් හිරබාරයට ගනු ලැබූ පසු, ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ සුබ අස්න දේශනා කරමින් ගලීලයට වැඩිය සේක. ඒ දේශනාව මේ ය. "නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්න ය. මනස්ථාපනය වන්න. සුබ අස්න අදහාගන්න" යනුයි.

සුවිශේෂ වාක්‍යය එසේ ය.